# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 ජනවාරි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 ජනවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 16.8%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2021 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 14.0%ක් ලෙස වාර්තා විය. 2022 ජනවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 11.4%ක හා ආහාර නොවන කාණ්ඩයේ 5.4%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 ජනවාරි මාසයේ 3.7%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 2.7%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.0%ක් විය. 2021 ජනවාරි මාසයට සාපේක්ෂව 2022 ජනවාරි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. ඒ අනුව, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2021 දෙසැම්බර් මාසයේදී 21.5% සිට 2022 ජනවාරි මාසයේදී 24.4% දක්වා වැඩි වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2021 දෙසැම්බර් මාසයේදී 7.6% සිට 2022 ජනවාරි මාසයේදී 10.2% දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2021 දෙසැම්බර් මාසයේ 161.0ක් වූ දර්ශකාංකය 2022 ජනවාරි මාසයේ 166.0ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 ජනවාරි මාසයේ දර්ශකාංකය 5.0ක වැඩිවීමක් එනම් 3.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 1.71%කින් වැඩිවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 1.35%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකුවිට සහල්, කිරිපිටි, පළතුරු, අළුත් මාළු, තිරිඟු පිටි, පාන්, එළවළු, පොල්තෙල්, කුකුළ් මස්, මිරිස් කුඩු, වියළි මිරිස්, අමු මිරිස්, මයිසූර් පරිප්පු, ළදරු කිරිපිටි, පොල්, කරවල, අර්තාපල්, රතු ළූණු, සහ ලොකු ළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා විය. කෙසේ වෙතත් දෙහි සහ බිත්තර යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 ජනවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' *(බුලත්)*, 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' *(ගොඩනැගිලි ද්‍රව්‍ය)*, 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'සෞඛ්‍ය' (පෞද්ගලික වෛද්‍ය ගාස්තු), 'ප්‍රවාහන' *(පෙට්‍රල්, ඩීසල් හා බස් ගාස්තු)*, 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' (*උපකාරක පංති ගාස්තු*), 'ආපනශාලා සහ හෝටල් සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'සන්නිවේදන' කාණ්ඩයේ මිල දර්ශක අගය වෙනසක් වී නොමැත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2021 දෙසැම්බර් මාසයේ 10.8% සිට 2022 ජනවාරි මාසයේ 12.9% දක්වා වැඩිවීමක් වාර්තා විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම: 2013=100), ජාතික පාරිභෝගික මිල දර්ශකය (යටිදැරි), ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සහ ලක්ෂ්‍යමය යටිදැරි උද්ධමනයේ විචලනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| **2021** | ජන. | 142.1 | 151.4 | 134.7 | 141.0 | 0.6 | 0.4 | 3.7 | 5.9 | 1.8 | 4.2 |
| | පෙබ. | 142.8 | 152.8 | 134.9 | 141.3 | 0.5 | 0.2 | 4.2 | 6.9 | 1.9 | 4.1 |
| | මාර්තු | 142.1 | 150.7 | 135.3 | 141.8 | -0.5 | 0.4 | 5.1 | 8.8 | 2.0 | 4.3 |
| | අප්‍රේල් | 142.2 | 150.8 | 135.5 | 142.5 | 0.1 | 0.5 | 5.5 | 9.7 | 2.2 | 4.1 |
| | මැයි | 143.6 | 153.3 | 135.9 | 143.7 | 1.0 | 0.8 | 6.1 | 10.3 | 2.5 | 4.2 |
| | ජූනි | 145.7 | 157.3 | 136.5 | 144.6 | 1.5 | 0.6 | 6.1 | 9.8 | 2.9 | 4.1 |
| | ජූලි | 146.6 | 158.5 | 137.2 | 145.6 | 0.6 | 0.7 | 6.8 | 11.0 | 3.2 | 4.4 |
| | අගෝ. | 147.1 | 159.4 | 137.4 | 146.5 | 0.3 | 0.6 | 6.7 | 11.1 | 3.0 | 4.7 |
| | සැප්. | 147.5 | 159.6 | 137.9 | 147.2 | 0.3 | 0.5 | 6.2 | 10.0 | 3.0 | 4.8 |
| | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| **2022** | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |